උසස් අධ්‍යාපනයට මුදල් සොයාගැනීම සඳහා ලිංගික ශ්‍රමිකයින් ලෙසට සේවය කළ බව කියන තරුණියන් කණ්ඩායමක් ඇතුළු පිරිසක් තලංගම දී අත්අඩංගුවට ගැනීමේ සිදුවීමක්, පෙබ. 09, 2023 දින මාධ්‍ය තුළ අවධානයට ලක්ව තිබුණේ මෙසේයි.

* මව්බිම - "ඉගෙන ගන්න සල්ලි හොයන්න ඇඟ විකුණු තරුණියෝ පිරිසක් තලංගමදී කොටු" (අන්තර්ගතය තුළ: ...ලිංගික ශ්‍රමිකයින් ලෙස සේවය කළ තරුණියන්...)
* දිනමිණ - "තලංගම ස්පාවලින් ඇල්ලූ සුරූපිනියන් අතර උසස් අධ්‍යාපනය ලබන සිසුවියෝ 14ක් (අන්තර්ගතය තුළ: ...ගණිකා වෘත්තියේ යෙදී සිටි රූමත් තරුණියන්...)
* අද - "උසස් අධ්‍යාපනයට මුදල් සෙවීමට ගණිකා වෘත්තියේ නිරත තරුණියන් 14ක් අත්අඩංගුවට (අන්තර්ගතය තුළ: ...ගණිකා වෘත්තියේ නිරතව සිටි තරුණියන්...)
* ලංකාදීප - "උසස් අධ්‍යාපනයට මුදල් සොයාගන්න ගණිකා රස්සාවට බැහැලා: රූමතියෝ 14 ක් හඬාවැටෙති" (අන්තර්ගතය තුළ: ...ගණිකා වෘත්තියේ යෙදී සිටි රූමත් තරුණියන්...)

මෙම පුවත්පත් සියල්ලේම පළ වූ මෙම පුවත සඳහා එකම ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකු දායක වී ඇති බව නිරීක්ෂණය කරන්නට හැකි විණි. කෙසේ නමුත්, මව්බිම පුවත සඳහා එම ප්‍රාදේශීය මාධ්‍යවේදියා සමඟ තවත් ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකු දායක වී ඇති බවද දැකිය හැක.

1) "ගණිකා වෘත්තිය" හෝ "ගණිකාව" වැනි යෙදුම් සමඟ බැඳී ඇති ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්පයන් සමඟින් ගත් විට, ලිංගික ශ්‍රමිකයින්ව හැඳින්වීමට එවැනි යෙදුම් කෙතරම් යෝග්‍ය වන්නේ ද?
2) ලිංගික ශ්‍රමය ලබාදීම දැක්වීම සඳහා, "ඇඟ විකිණීම" වැනි සඳහන් යොදාගැනීම ඔස්සේ ද, ලිංගික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් එවැනි කොන් කිරීමක් සිදුවෙතැයි ඔබ නොසිතන්නේ ද?
3) ලිංගික ශ්‍රමිකයින් සම්බන්ධ යැයි පැවසෙන මෙවැනි පුවතක් සඳහා "සුරූපී", "රූමත්" වැනි විශේෂණ යොදාගැනීම ඔස්සේ, කාන්තාවන් ලිංගික වස්තුවක් ලෙසින් දැක්වීමක් සිදු නොවන්නේ ද?
4) එකම ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකු දායක වී විවිධ පුවත්පත් තුළ පළ වූ මෙම පුවතෙහි, සිරස්තල සහ, පුවත් අන්තර්ගතයේ දැක්වෙන විවිධ වෙනස්කම් සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

